# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1989 අංක 13 දරන
# නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන)
# පනත

---

[සහතිකය සටහන් කළේ 1989 ඔක්තෝබර් මස 12 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

1989 ඔක්තෝබර් මස 12 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිලදී ලබාගත හැකිය.

මිල : රු. 2.10 යි.    තැපැල් ගාස්තුව : රු. 1.15 යි.

# 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත

[සහතිකය සටහන් කළේ 1989 ඔක්තෝබර් මස 12 වන දින]

එල්. ඩී.—ඕ. 7/89.

ශ්‍රී ලංකාවෙහි නිෂ්පාදනය කරන ලද හෝ සාදන ලද හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ භාණ්ඩ මත නිෂ්පාදන බද්දක් පනවා අය කිරීම සඳහා සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

ලුහුඬු නාමය සහ ක්‍රියාත්මක වන දිනය.

1. මේ පනත 1989 අංක 13 දරන නිෂ්පාදන බදු (විශේෂ විධිවිධාන) පනත යනුවෙන් හඳුන්වනු ලබන අතර, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් නියම කරනු ලබන දිනයක සිට එය ක්‍රියාත්මක විය යුතුය. මේ පනතේ විවිධ විධිවිධාන සම්බන්ධයෙන් වෙන වෙනම දිනයන් නියම කරනු ලැබිය හැකි ය.

## I වන කොටස
## පරිපාලනය

නිෂ්පාදන බදු අධ්‍යක්ෂ ජනරාල්වරයා යනාදීන් පත් කිරීම.

2. (1) මේ පනතේ කාර්යයන් සඳහා—

(අ) (මෙහි මින් මතු "අධ්‍යක්ෂ ජනරාල්වරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) නිෂ්පාදන බදු අධ්‍යක්ෂ ජනරාල්වරයෙක් ;

(ආ) නිෂ්පාදන බදු අධ්‍යක්ෂවරයෙක් සහ මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ කාර්යයන් සඳහා අවශ්‍ය විය හැකි නිෂ්පාදන බදු නිලධරයන් සංඛ්‍යාවක් ; සහ

(ඇ) ඉහත සඳහන් නිලධරයන්ට සහාය වීම සඳහා අවශ්‍ය විය හැකි ලිපිකරු සහ කණිෂ්ඨ සේවක සංඛ්‍යාවක්

නමින් හෝ නිලයෙන් පත් කරනු ලැබිය හැකිය.

(2) යම් නිෂ්පාදන බදු නිලධරයකු පත් කිරීමේ ලේඛනයෙහි ඒ නිලධරයා පත් කරනු ලබන්නේ යම් ප්‍රදේශයකට ද ඒ ප්‍රදේශය නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය. එසේ නිශ්චිතව සඳහන් ප්‍රදේශය, මෙහි මින් මතු "ඔහුගේ පත්වීමේ ප්‍රදේශය" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(3) නිෂ්පාදන බදු අධ්‍යක්ෂවරයා විසින්, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, මේ පනතින් හෝ එය යටතේ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පිරිනමා ඇති හෝ නියම කර ඇති හෝ වෙන් කර දී ඇති හෝ බලතල, කාර්යයන් හෝ කර්තව්‍යයන් සියල්ල නැතහොත් ඒවායින් කිසිවක් හෝ ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම, කරනු ලැබිය හැකි ය.

(4) සෑම නිෂ්පාදන බදු නිලධරයකු විසින් ම, ඔහුගේ පත්වීමේ ප්‍රදේශය ඇතුළත අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සාමාන්‍ය විධානයට සහ පාලනයට යටත්ව, මේ පනතින් හෝ එය යටතේ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත පිරිනමා හෝ නියම කර හෝ වෙන් කර දී

ඇති බලතල, කාර්යයන් හෝ කර්තව්‍යයන් සියල්ල නැතහොත් ඒවායින් කිසිවක් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කරනු ලැබිය හැකි ය.

## II වන කොටස
## නිෂ්පාදන බද්ද

නිෂ්පාදන බදු ප්‍රමාණයන් නිර්ණය කිරීම.

3. (1) ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින්, අමාත්‍යවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන ප්‍රමාණයක් නැත හොත් ප්‍රමාණය මත නිෂ්පාදන බද්දක් ශ්‍රී ලංකාවෙහි සාදන ලද හෝ නිෂ්පාදනය කරන ලද හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද හෝ සෑම භාණ්ඩයක් සම්බන්ධයෙන් පනවා අය කර ගනු ලැබිය යුතු අතර, එය ගෙවනු ලැබිය යුතු ය. මේ වගන්තිය යටතේ නියමයක් කරනු ලැබුවේ යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් ද ඒ සෑම භාණ්ඩයක් ම මෙහි මින් මතු "නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක්" යනුවෙන් සඳහන් කරනු ලැබේ.

(2) භාණ්ඩ වෙනුවෙන් පනවනු ලබන නිෂ්පාදන බද්දෙහි ප්‍රමාණය හෝ ප්‍රමාණ භාණ්ඩවල පන්තිය හෝ විස්තරය සැලකිල්ලට ගැනීමෙන් නිර්ණය කරනු ලැබිය හැකි අතර, ඒ අනුව, විවිධ පන්තිවලට හෝ විස්තරවලට අයත් භාණ්ඩ වෙනුවෙන් විවිධ ප්‍රමාණවල නිෂ්පාදන බද්දක් නිර්ණය කරනු ලැබිය හැකි ය.

(3) (2) වන උපවගන්තිය යටතේ නිර්ණය කරන ලද නිෂ්පාදන බදු ප්‍රමාණය හෝ ප්‍රමාණ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් කලින් කල වෙනස් කරනු ලැබිය හැකි ය.

(4) මේ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් කරනු ලබන සෑම නියමයක් ම, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි හෝ එම නියමයෙහි සඳහන් කරනු ලබන පසු දිනයක හෝ බලාත්මක විය යුතු අතර, එය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබූ දිනයෙහි සිට මාස හතරක කාල පරිච්ඡේදයක් ඇතුළත දී හෝ එම කාල පරිච්ඡේදය ඇතුළත පාර්ලිමේන්තුවේ රැස්වීම් නොපැවැත්වේ නම්, එම කාල පරිච්ඡේදය අවසන් වීමෙන් පසුව පැවැත්වෙන ප්‍රථම පාර්ලිමේන්තු රැස්වීමේ දී, එම නියමය අනුමත කළ යුතු බවට වූ යෝජනාවක් මගින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(5) පාර්ලිමේන්තුව විසින් අනුමත කිරීම ප්‍රතික්ෂේප කරනු ලබන යම් නියමයක්, එම නියමය යටතේ කලින් කරන ලද කිසිවකට හානියක් නොවන පරිදි, ඒ ප්‍රතික්ෂේප කිරීමේ දින සිට පරිච්ඡින්න කරන ලද සේ සැලකිය යුතුය. එම නියමය එසේ පරිච්ඡින්න කරන ලද දිනය ලෙස සැලකෙන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු ය.

(6) ආණ්ඩුව විසින් හෝ ආණ්ඩුව වෙනුවෙන් හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද නැතහොත් ශ්‍රී ලංකාවේ දී නිෂ්පාදනය කරන ලද හෝ සාදන ලද හෝ නිෂ්පාදන බද්දට යටත් යම් භාණ්ඩයක්, මේ පනත යටතේ එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය සම්බන්ධයෙන් පනවනු ලැබිය හැකි නිෂ්පාදන බද්දට යටත් වන්නේ ය.

ඉවත් කර ගෙන යාම පිළිබඳ දැන්වීම.

4. (1) නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ කිසිවක් සාදන්නකු, එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩවලින් යම් ප්‍රමාණයක්, එම භාණ්ඩ නිෂ්පාදනය කරන ලද නැතහොත් සාදන ලද කර්මාන්ත ශාලාවේ සිට හෝ වෙනත් ස්ථානයක සිට ඉවත් කර ගෙන යාමට හෝ ඉවත් කර ගෙන යාමට සැලැස්වීමට අදහස් කරන අවස්ථාවක, ඔහු විසින් ඒ කරුණ පිළිබඳව යටත් පිරිසෙයින් පැය පනලිස් අටකට පෙර දැනුම් දීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ ඒ කාර්ය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරන ලද නිෂ්පාදන බදු නිලධරයකු වෙත කරනු ලැබිය යුතු ය.

(2) නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ කිසිවක් ආනයනය කරන්නකු, එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩවලින් යම් ප්‍රමාණයක්, එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ ආනයනය කිරීමෙන් පසුව ගබඩා කර තබනු ලැබූ රේගු ගුදමෙහි නැතහොත් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද වෙනත් ස්ථානයක සිට ඉවත් කර ගෙන යාමට හෝ ඉවත් කර ගෙන යාමට සැලැස්වීමට අදහස් කරන අවස්ථාවක, ඔහු විසින්, ඒ කරුණ පිළිබඳව යටත් පිරිසෙයින් පැය හතලිස් අටකට පෙර දැනුම් දීමක් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ ඒ කාර්යය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නම් කරන ලද නිෂ්පාදන බදු නිලධරයකු වෙත කරනු ලැබිය යුතුය.

නිෂ්පාදන බද්ද ගෙවීම.

5. (1) නිෂ්පාදන බද්දට යටත් යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් 3 වන වගන්තිය යටතේ පනවන ලද නිෂ්පාදන බද්ද—

(අ) ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය ශ්‍රී ලංකාවෙහි නිෂ්පාදනය කරන ලද හෝ සාදන ලද හෝ අවස්ථාවක දී, ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය නිෂ්පාදනය කරන ලද හෝ සාදන ලද හෝ කර්මාන්ත ශාලාවෙහි නැතහොත් වෙනත් ස්ථානයෙහි සිට, එය ඉවත් කර ගෙන යාමට පෙර නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයේ නිෂ්පාදකයා හෝ සාදන්නා හෝ විසින් නියමිත ආකාරයට, ගෙවනු ලැබිය යුතු ය ; නැතහොත්

(ආ) ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබ ඇති අවස්ථාවක, එය ශ්‍රී ලංකාවට ආනයනය කරනු ලැබූ වහාම එය ගබඩා කර තබනු ලැබූ රේගු ගුදමෙහි හෝ වෙනත් ස්ථානයෙහි සිට එය ඉවත් කර ගෙන යාමට පෙර ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයේ ආනයනකරු විසින්, නියමිත ආකාරයට ගෙවනු ලැබිය යුතු ය.

(2) නිෂ්පාදන බද්දට යටත් යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් නිෂ්පාදන බද්ද (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූල ව ගෙවනු ලැබ නැති අවස්ථාවක, ඒ නිෂ්පාදන බද්ද ගෙවීම පැහැර හැර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.

නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ ඉවත් කර ගෙන යාමට පෙර බද්ද ගෙවිය යුතු වීම.

6. කිසිම තැනැත්තකු විසින්—

(අ) යම් නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක්, නිෂ්පාදනය කරන ලද නැතහොත් සාදන ලද යම් කර්මාන්ත ශාලාවක හෝ වෙනත් ස්ථානයක හෝ සිට ; නැතහොත්

(ආ) යම් නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් ශ්‍රී ලංකාවට ආනයනය කිරීමෙන් පසුව එය ගබඩා කර තැබූ යම් රේගු ගුදමක හෝ වෙනත් ස්ථානයක හෝ සිට

ඉවත් කර ගෙන යාම හෝ ඉවත් කර ගෙන යාමට ඉඩ දීම හෝ මේ පනතේ විධිවිධානවලට අනුකූලව එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය සම්බන්ධයෙන් ගෙවිය යුතු නිෂ්පාදන බද්ද ගෙවා ඇත්නම් හෝ එම බද්ද ගෙවීම සඳහා බැඳුම්කරයක් ලියා අත්සන් කර ඇත්නම් හෝ එම බද්ද ගෙවීම සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් වන පරිදි ප්‍රමාණවත් ඇපයක් සලසා ඇත්නම් මිස හෝ එසේ කරන තුරු නොකළ යුතු ය :

එසේ වුව ද ශ්‍රී ලංකාවෙහි නිෂ්පාදනය කරන ලද හෝ සාදන ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක්, එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය යවනු ලබන වරායට ගොඩ බෑම් සම්බන්ධයෙන් බැඳුම්කරයක් ලියා අත්සන් කර ඇත්නම්, නිෂ්පාදන බද්ද ගෙවීමක් නොමැතිව එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය ඒම භාණ්ඩය නිෂ්පාදනය කරන ලද නැතහොත් සාදන ලද කර්මාන්ත ශාලාවේ හෝ ස්ථානයේ හෝ සිට අපනයනය කිරීමේ කාර්ය සඳහා ඉවත් කර ගෙන යනු ලැබිය හැකි ය.

නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයේ වටිනාකම නියම කරන ආකාරය.

7. (1) නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් සම්බන්ධයෙන් එහි වටිනාකම අනුව නිෂ්පාදන බද්දක් මේ පනත යටතේ පනවනු ලබන අවස්ථාවක ඒ වටිනාකම—

(අ) එහි සාමාන්‍ය මිල, එනම් ඉවත් කර ගෙන යන වේලාවේ දී ගා ස්ථානයේ දී භාර දීම සඳහා තොග වෙළෙඳාමේ දී මිලට ගැනුම්කරු, සබැඳි තැනැත්තකු නොවන්නා වූ ද විකිණීමේ එකම ප්‍රතිෂ්ඨාව මිල වන්නා වූ ද අවස්ථාවක තක්සේරු ලාභියකු විසින් මිලට ගැනුම්කරුවකු වෙත නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සාමාන්‍යයෙන් විකුණනු ලබන මිල, වශයෙන් සලකනු ලැබිය යුතු ය :

එසේ වුව ද—

(i) එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ පිළිබඳ තොග වෙළෙඳාමේ සාමාන්‍ය පරිචය අනුව, තක්සේරු ලාභියා විසින් එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සබැඳි තැනැත්තන් නොවන විවිධ පන්තිවල මිලට ගැනුම් කරුවන්ට විවිධ මිල ගණන්වලට විකුණනු ලබන අවස්ථාවක, ඒ එක් එක් මිල ඒ එක් එක් පන්තියේ මිලට ගැනුම්කරුවන් සම්බන්ධයෙන්, නිෂ්පාදන බද්දට යටත් එම භාණ්ඩයේ සාමාන්‍ය මිල ලෙස සලකනු ලැබිය යුතු ය ;

(ii) එවැනි නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ තක්සේරුලාභියා විසින්, තොග වෙළෙඳාමේ දී, ඉවත් කර ගෙන යන වේලාවේ දී සහ ස්ථානයේ දී භාර දීම සඳහා තත් කාලයෙහි බල පවත්නා යම් නීතියක් යටතේ නියම කරන ලද මිලකට හෝ, ඒ නීතිය යටතේ නියම කර ඇති උපරිම මිලට විකුණනු ලබන අවස්ථාවක, එවිට මේ අතුරු විධානයේ (iii) වන අනුඡේදයෙහි කුමක් සඳහන්ව ඇත ද, විකුණනු ලබන නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය සම්බන්ධයෙන් එසේ නියම කරන ලද අවස්ථාවෝචිත පරිදි වූ මිල හෝ උපරිම මිල හෝ එහි සාමාන්‍ය මිල ලෙස සලකනු ලැබිය යුතු ය;

(iii) එවැනි නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ, සබැඳි තැනැත්තකුට හෝ සබැඳි තැනැත්තකු මගින් හෝ හැර තක්සේරුලාභියා විසින් තොග වෙළෙඳාමේ දී විකුණනු නොලබන අවස්ථාවක, තක්සේරුලාභියා විසින් නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ ඒ සබැඳි තැනැත්තාට හෝ සබැඳි තැනැත්තා මගින් සාමාන්‍යයෙන් විකුණනු ලබන මිල, සබැඳි තැනැත්තන් නොවන විකුණුම් කරුවන්ට හෝ නිෂ්පාදන බද්දට යටත් එවැනි භාණ්ඩ එවැනි විකුණුම්කරුවන් වෙත නොවිකුණන අවස්ථාවක, එවැනි නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සිල්ලරට විකුණන්නා වූ සබැඳි තැනැත්තන් වන විකුණුම්කරුවන්ට හෝ තොග වෙළෙඳාමේදී ඉවත් කර ගෙන යන අවස්ථාවේ සාමාන්‍යයෙන් විකුණනු ලබන මිල ලෙස සලකනු ලැබිය යුතු ය.

(ආ) නිෂ්පාදන බද්දට යටත් එවැනි භාණ්ඩ විකුණනු නොලැබීම නැතහොත් වෙනත් යම් හේතුවක් නිසා එවැනි නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩවල සාමාන්‍ය මිල නිශ්චය කරගත නොහැකි වන අවස්ථාවක දී නියමිත ආකාරයට තීරණය කරනු ලබන නිශ්චය කරනු ලැබිය හැකි ආසන්නතම සමාන මිල විය යුතු ය.

(2) යම් නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් සම්බන්ධයෙන්, එය ඉවත් කර ගෙන යාමේ ස්ථානයේ දී භාර දීම සඳහා වූ මිල නොදන්නා වූ ද, එහි වටිනාකම, ඉවත් කර ගෙන යාමේ ස්ථානය නොවන වෙනත් ස්ථානයකට භාර දීම සඳහා වූ මිල සැලකිල්ලට ගෙන තීරණය කරනු ලබන්නා වූ ද අවස්ථාවක, ඉවත් කර ගෙන යාමේ ස්ථානයේ සිට භාර දීමේ ස්ථානය දක්වා ප්‍රවාහනය කිරීමේ වියදම ඒ මිලට ඇතුළත් නොකළ යුතු ය.

(3) මේ වගන්තියෙහි—

(අ) "තක්සේරුලාභියා" යන්නෙන් 5 වන වගන්තිය යටතේ නිෂ්පාදන බද්ද ගෙවීමට යටත් තැනැත්තා අදහස් වන අතර ඔහුගේ නියෝජිතයාද ඊට ඇතුළත් වේ;

(ආ) "ඉවත් කර ගෙන යෑමේ ස්ථානය" යන්නෙන්—

(i) නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සාදන හෝ නිෂ්පාදනය කරන කර්මාන්ත ශාලාවක් හෝ වෙනත් යම් ස්ථානයක් ; හෝ

(ii) නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ ආනයනය කිරීමෙන් පසු එම භාණ්ඩ ගබඩා කර ඇත්තේ හෝ තබා ඇත්තේ යම් රේගු ගුදමක ද නැත හොත් රේගු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් අනුමත කරන ලද යම් ස්ථානයක ද එම ගුදම හෝ ස්ථානය හෝ

අදහස් වේ ;

(ඇ) "සබැඳි තැනැත්තා" යන්නෙන් යම් තැනැත්තකු තක්සේරු ලාභියා සමග ඇති තමාගේ සම්බන්ධතාව අනුව ඔවුන්ට එකිනෙකාගේ ව්‍යාපාර කටයුතු විෂයෙහි කෙලින්ම සම්බන්ධකමක් ඇති වන්නේ ද එවැනි තැනැත්තකු අදහස් වන අතර එයට පාලක සමාගමක් ද, පාලිත සමාගමක් ද තක්සේරුලාභියාගේ ඥාතියකු සහ භාණ්ඩ බෙදා හරින්නකු සහ එම භාණ්ඩ බෙදාහරින්නාගේ යම් උප බෙදා හරින්නකුද ඇතුළත් වේ ;

(ඈ) "වටිනාකම" යන්න ඉවත්කරගෙන යාමේ අවස්ථාවේ දී, අසුරනු ලැබූ තත්ත්වයකින් බාර දෙනු ලබන්නා වූ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සම්බන්ධයෙන් යෙදෙනවිට, කල් පවතින ස්වභාවයෙන් යුතු හා ගැනුම්කරු විසින් තක්සේරුලාභියාවෙත ආපසු දෙනු ලැබිය යුතු එවැනි ඇසුරුමක මිල ද ඊට ඇතුළත් වන නමුත්, එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සම්බන්ධයෙන් ගෙවිය යුතු නිෂ්පාදන බද්ද, පිරිවැටුම් බද්ද සහ වෙනත් බදු ඇත්නම් ඒවාද, විකුණනු ලැබූ හෝ විකිණීම සඳහා නිෂ්පාදනය කරන ලද හෝ සාදන ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සම්බන්ධයෙන් තොග වෙළඳාමේ සාමාන්‍ය පරිචය අනුව ඉවත් කර ගෙන යාමේ අවස්ථාවේ දී දෙනු ලබන වෙළෙඳ වට්ටම් ද ඊට ඇතුළත් නොවේ ;

(ඉ) "තොග වෙළඳාම" යන්නෙන් ආණ්ඩුව, පළාත් පාලන ආයතන, වෙළඳුන්, කර්මාන්ත පාරිභෝගිකයන් සහ තම අවශ්‍යතාවන් සිල්ලරට නොව අන්‍යාකාරයෙන් මිල දී ගන්නා වෙනත් තැනැත්තන් වෙත කරනු ලබන විකිණීම් අදහස් වේ.

නිෂ්පාදන බද්ද අඩු කිරීම.

8. (1) ස්වාභාවික හේතුවක් නිසා හෝ අන් හේතුවක් නිසා තත්ත්වයෙන් ඌන වී ඇති බව සොයා ගනු ලබන, නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ මත අය කළ හැකි නිෂ්පාදන බද්ද අඩු කිරීම සඳහා අමාත්‍යවරයා විසින්, මේ පනත යටතේ සාදනු ලබන නියෝග මගින්, විධිවිධාන සලස්වනු ලැබිය හැකි ය.

(2) නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩවල ස්වභාවය හෝ එම භාණ්ඩ සැකසුම් කිරීම හෝ පිරිසිදු කිරීම හා ඒවා ගබඩාගත කිරීමේ හෝ මාර්ගස්ථව තිබීමේ කාලය සැලකිල්ලට ගෙන, එවැනි අඩුකිරීම්වලට ඉඩදීමේ දී නොඉක්මවිය යුතු ප්‍රතිශත සීමා එවැනි යම් නියෝග මගින් නියම කරනු ලැබිය හැකිය.

## III වන කොටස

### අයකර ගැනීම

නිෂ්පාදන බද්ද නොගෙවීම.

9. (1) යම් නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් මත නිෂ්පාදන බද්දක් අය කරනු ලැබ නැති හෝ ගෙවනු ලැබ නැති අවස්ථාවක දී හෝ එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය මත වූ නිෂ්පාදන බද්දෙන් කොටසක් පමණක් අය කරනු ලැබ ඇති හෝ එම බද්ද වැරදීමකින් ආපසු ගෙවනු ලැබ ඇති අවස්ථාවකදී අයකරනු ලැබ නැති හෝ ගෙවනු ලැබ නැති නැතහොත් සම්පූර්ණයෙන් අයකරනු ලැබ නැති හෝ ගෙවනු ලැබ නැති නිෂ්පාදන බද්ද අයකර ගත යුත්තේ යම් තැනැත්තකුගෙන් ද නැතහොත් වැරදීමකින් ආපසු ගෙවීමක් සිදු කරනු ලැබ ඇත්තේ යම් තැනැත්තකු වෙතද ඒ තැනැත්තා වෙත අදාළ දිනයේ සිට එක් අවුරුද්දක කාලපරිච්ඡේදය ඇතුළත නිෂ්පාදන බදු නිලධරයකු විසින් දැන්වීමක් යැවිය හැකි අතර, එම දැන්වීමේ සඳහන් මුදල ඔහු විසින් නොගෙවිය යුත්තේ මන්දැයි හේතු දක්වන ලෙස එම දැන්වීම මගින් ඔහුට නියම කළ යුතු ය:

එසේ වුව ද මේ පනතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක විධිවිධානවලින් යම් විධිවිධානයක් කඩ කෙරෙන සේ යම් නිෂ්පාදන බද්දක් කිසිසේත් අය කරනු ලැබ නැති හෝ ගෙවනු ලැබ නැති හෝ කොටසක් පමණක් අය කරනු ලැබ ඇති හෝ ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී හෝ වංචාව, අපසහායකත්වය හෝ සිතාමතා කරන ලද යම් වැරදි ප්‍රකාශයක් හෝ සිද්ධිමය කරුණු යටපත් කිරීමක් යන හේතු නිසා එම බද්ද වැරදීමකින් ආපසු ගෙවනු ලැබ ඇති අවස්ථාවක දී මේ උපවගන්තියේ සඳහන් කාල පරිච්ඡේදය ඒ බව සොයා ගනු ලැබූ දින සිට අවුරුදු දහයක් දක්වා දීර්ඝ විය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ දැන්වීම ලැබූ තැනැත්තා විසින් කරන ලද කරුණු දැක්වීම් කිසිවක් වේනම් ඒ කරුණු දැක්වීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකා බැලීමෙන් පසුව, දැන්වීමෙහි නිශ්චිතව සඳහන් මුදලට වැඩි නොවන මුදලක් විය යුතු එම තැනැත්තා ගෙන් අයවිය යුතු නිෂ්පාදන බදු මුදල අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තිරණය කරනු ලැබිය යුතු අතර, ඒ අනුව ඔහුට දැනුම් දිය යුතුය. තවද එවිට එසේ තිරණය කරනු ලැබූ මුදල ඒ තැනැත්තා විසින් ගෙවනු ලැබිය යුතුය.

(3) මේ වගන්තියෙහි—

(i) "ආපසු ගෙවීම" යන්නට, ශ්‍රී ලංකාවෙන් අපනයනය කරනු ලබන, නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ මත වූ නිෂ්පාදන බද්දේ ප්‍රතිදානයක් ඇතුළත් වේ;

(ii) "අදාළ දිනය" යන්න නිෂ්පාදන බද්ද අය කරනු නොලැබූ හෝ ගෙවනු නොලැබූ හෝ කොටසක් පමණක් අය කරනු ලැබූ හෝ ගෙවනු ලැබූ හෝ බද්ද වැරදීමකින් ආපසු ගෙවනු ලැබූ හෝ නිෂ්පාදන බද්දට යටත් යම් භාණ්ඩයක් සම්බන්ධයෙන් යෙදෙන විට ඉන්—

(අ) වාර්තාව අදාළ වන නියමිත කාල පරිච්ඡේදය ඇතුළත ඉවත් කර ගන්නා ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සම්බන්ධයෙන් ගෙවන ලද නිෂ්පාදන බද්ද පිළිබඳ විස්තර සහිත වාර්තාවක් නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සාදන්නකු හෝ නිෂ්පාදනය කරන්නකු හෝ ආනයනය කරන්නකු විසින් හෝ ගුදමක අයිතිකරුවකු විසින් මේ පනත යටතේ ඉදිරිපත් කිරීමට නියමිත අවස්ථාවක දී, එම වාර්තාව ඉදිරිපත් කරනු ලැබූ දිනය අදහස් වේ;

(ආ) ඉහත කී පරිදි වූ කිසිම වාර්තාවක් ඉදිරිපත් කරනු නොලැබූ අවස්ථාවක දී මේ පනත යටතේ ඒ වාර්තාව ඉදිරිපත් කළ යුතු අවසාන දිනය අදහස් වේ;

(ඇ) නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සම්බන්ධයෙන් වූ නිෂ්පාදන බද්ද වැරදීමකින් ආපසු ගෙවනු ලැබූ අවස්ථාවක දී, එසේ ආපසු ගෙවනු ලැබූ දිනය අදහස් වේ; තවද

(ඈ) වෙනත් යම් අවස්ථාවක දී, මේ පනත යටතේ හෝ එය යටතේ සාදන ලද නියෝග යටතේ බද්ද ගෙවිය යුතු දිනය අදහස් වේ.

අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත කෙරෙන අභියාචනා.

10. (1) යම් තැනැත්තෙකු 9 වන වගන්තිය යටතේ තමා සම්බන්ධයෙන් කරන ලද යම් තීරණයකින් අතෘප්තියට පත් වන්නේ නම්, ඒ තීරණය පිළිබඳ දැන්වීම තමා වෙත භාර දීමෙන් පසු දින තිහක් ඇතුළත ඔහු විසින් එම තීරණයට විරුද්ධව අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත අභියාචනය කරනු ලැබිය හැකිය. එම අභියාචනය නොතකා ඒ තැනැත්තා විසින් එම තීරණය අනුව ගෙවිය යුතු නිෂ්පාදන බද්ද ගෙවනු ලැබිය යුතුය :

එසේ වුව ද ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ රෝගාතුරවීම හෝ වෙනත් සාධාරණ හේතුවක් නිසා එම කාල පරිච්ඡේදය ඇතුළත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අභියාචකට නොහැකි වූ බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් අභියාචනය ඉදිරිපත් කිරීම සඳහා වූ කාල පරිච්ඡේදය දීර්ඝ කරනු ලැබිය යුතුය.

(2) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලැබූ අභියාචනයක්, අභියාචනයක් ඉදිරිපත් කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ ලබා දී ඇති කාල පරිච්ඡේදය ඉකුත් වූ පසු ඉදිරිපත් කරනු ලැබුවහොත් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එය නිෂ්ප්‍රභ කරනු ලැබිය යුතුය.

(3) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් සම්බන්ධයෙන් තමාගේ තීරණයට එළඹීමට පෙර, අභියාචක විසින් පෞද්ගලිකවම හෝ ඔහු විසින් බලය දෙන ලද නියෝජිතයකු මගින් හෝ අභියාචකගේ කරුණු ඉදිරිපත් කිරීමේ අවස්ථාවක් ඔහුට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබා දිය යුතුය.

(4) යම් තීරණයකට එරෙහිව (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම තීරණය ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ අවලංගු කිරීම කරනු ලැබිය හැකිය.

(5) (1) වන උපවගන්තිය යටතේ තමා වෙත ඉදිරිපත් කරන ලද යම් අභියාචනයක් මත අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරන ලද යම් තීරණයකින් අතෘප්තියට පත් වන යම් තැනැත්තකු විසින් එම තීරණයට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකිය.

(6) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණයකට විරුද්ධව අභියාචනාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන අභියාචනවලට කාර්මික ආරාවුල් පනතේ 31ඇ වගන්තියේ (3), (4) සහ (5) වන උපවගන්තිවල විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

අභියාචනයේදී තීරණය කරනු ලබන නිෂ්පාදන බද්ද අවසානාත්මක විය යුතු බව.

**11.** නිෂ්පාදන බද්ද සම්බන්ධයෙන් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ තීරණයට විරුද්ධව මේ පනතේ නිශ්චිතව සඳහන් කාල පරිච්ඡේදය ඇතුළත වලංගු අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබ නොමැති අවස්ථාවක, හෝ අභියාචනයේ දී එම බද්දේ මුදල තීරණය කරනු ලැබ ඇති අවස්ථාවක, අවස්ථෝචිත පරිදි, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් තීරණය කරනු ලැබූ පරිදි වූ මුදල් ප්‍රමාණය හෝ අභියාචනයේ දී අඩු කළ හෝ වැඩි කළ හෝ ස්ථිර කළ මුදල් ප්‍රමාණය මේ පනතේ සියලු කාර්ය සඳහා, ගෙවිය යුතු නිෂ්පාදන බද්දේ මුදල සම්බන්ධයෙන්, අවසානාත්මක හා තීරණාත්මක විය යුතු ය.

බදු අය කර ගැනීම සඳහා මහේස්ත්‍රාත්වරයකු ඉදිරියේ වූ නඩු කටයුතු.

**12.** (1) නිෂ්පාදන බද්ද ගෙවීම පැහැර ඇති අවස්ථාවක, ගෙවීම පැහැර හරිනු ලැබ ඇති නිෂ්පාදන බදු මුදල් ප්‍රමාණයේ විස්තර සහ පැහැර හරින්නාගේ නම සහ අන්තිමට දැන සිටි ව්‍යාපාර ස්ථානය හෝ පදිංචි ස්ථානය සඳහන් සහතිකයක්, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් එම ව්‍යාපාර ස්ථානය හෝ පදිංචි ස්ථානය පිහිටි කොට්ඨාසය විෂයෙහි අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයා වෙත නිකුත් කරනු ලැබිය හැකි ය. ඉන් පසුව පැහැර හරින්නාට විරුද්ධව නිෂ්පාදන බද්ද අයකර ගැනීම සඳහා වැඩිදුර නඩු කටයුතු කරගෙන නොයා යුතු මන්දැයි හේතු පෙන්වීම සඳහා මහේස්ත්‍රාත්වරයා විසින් තමා ඉදිරියට ඔහු කැඳවිය යුතු ය. ප්‍රමාණවත් හේතු පෙන්වීම පැහැර හරිනු ලැබුවහොත්, ගෙවීම පැහැර හරිනු ලැබ ඇති නිෂ්පාදන බද්ද, දඩයකින් පමණක්

දඩුවම් කරනු ලැබිය හැකි හෝ බන්ධනාගාරගත කිරීමෙන් දඬුවම් කරනු ලැබිය නොහැකි වරදක් සඳහා ඒ පැහැර හරින්නාට මහේස්ත්‍රාත්වරයා විසින් නියම කරනු ලැබූ දඩයක් සේ සලකනු ලැබිය යුතු අතර, ඊට පසුව, එවැනි වරදක් සඳහා නියම කරන ලද දඩයක් ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් වූ අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (එම උප වගන්තියේ (අ), (ඈ) සහ (එ) ඡේද හැර) විධිවිධාන අදාළ විය යුතු ය. තව ද එම දණ්ඩන නියමය කරන වේලාවේ දී එම උප වගන්තියේ විධිවිධාන අනුව මහේස්ත්‍රාත්වරයාට කළ හැකිව තිබූ යම් විධානයක් මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකි ය :

එසේ වුව ද, මේ වගන්තියේ කිසිවකින්, ඒ යටතේ වූ යම් නඩු කටයුත්තක දී, අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහතිකයේ ඇති යම් ප්‍රකාශයක නිරවද්‍යතාව සළකා බැලීමට, විභාග කිරීමට හෝ තීරණය කිරීමට මහේස්ත්‍රාත්වරයාට බලය දීම හෝ නියම කිරීම සිදු නොවන්නේ ය.

(2) මේ වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් යම් අවස්ථාවක දී අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 291 වන වගන්තියේ (2) සිට (5) තෙක් වූ වගන්තිවල කිසිවක් අදාළ නොවිය යුතු ය.

(3) පැහැර හරින්නාට (1) වන උපවගන්තිය යටතේ කරන ලදැයි සලකන දඩය ගෙවීම පැහැර හැරීම සම්බන්ධයෙන් පැහැර හරින්නාට සිර දඬුවමක් නියම කරනු ලැබූ එම උපවගන්තියේ සඳහන් යම් අවස්ථාවක, එකී දඩයේ මුදල් ගෙවීම සඳහා කල් දීම හෝ එම මුදල වාරික මගින් ගෙවීමට විධාන කිරීම මහේස්ත්‍රාත්වරයා විසින් කළ හැකි ය.

(4) (1) වන උපවගන්තියේ විධිවිධාන සළස්වා ඇති පරිදි හේතු පෙන්වීමට හෝ (3) වන උපවගන්තිය යටතේ දඩය ගෙවීමට හෝ කල් දීම සඳහා පූර්ව කොන්දේසියක් වශයෙන් ඇප තබන ලෙස අධිකරණය විසින් නියම කරනු ලැබිය හැකි අතර, එසේ ඇප තබන ලෙස පැහැර හරින්නාට නියම කරනු ලැබූ අවස්ථාවක 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ XXXIV වන පරිච්ඡේදයේ විධිවිධාන අදාළ විය යුතු ය.

(5) (3) වන උපවගන්තිය යටතේ වාරික මගින් ගෙවීමට විධාන කරනු ලැබ, යම් වාරිකයක් ගෙවීම පැහැර හැර ඇති අවස්ථාවක, එවකට නොගෙවා ඉතිරිව තිබූ සියලු වාරික ගෙවීම් පැහැර හැර ඇති පරිද්දෙන් එම නඩු කටයුතු කරනු ලැබිය හැකි ය.

(6) (1) වන උපවගන්තිය යටතේ වූ යම් නඩු කටයුත්තක දී, නිෂ්පාදන බද්ද පැහැර හැර ඇති බවට වූ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සහතිකය ප්‍රමාණවත් සාක්ෂි විය යුතු අතර, නිෂ්පාදන බද්ද අධික බවට, වැරදි බවට හෝ අභියාචනයට භාජනව පවතින බවට වූ යම් උත්තරවාදයක් භාර නොගත යුතු ය :

එසේ වුවද තමාට විරුද්ධව නඩු කටයුතු කරනු ලැබූ යම් තැනැත්තකු, අය කරනු ලබන නිෂ්පාදන බද්ද තීරණය කෙරෙන තීරණයට විරුද්ධව නිසි කලට අභියාචනයක් ඉදිරිපත්

කර නැත්තා වූ අවස්ථාවක, තමා එසේ අභියාචන කළේ නම් අයකරනු ලබන ප්‍රමාණයට වඩා නිෂ්පාදන බද්ද අධික යයි කියා සිටින්නේ නම්, නිෂ්පාදන බද්දට තමාගේ විරෝධය අධ්‍යක්ෂ ජනරාල්වරයාට ඉදිරිපත් කළ හැකි වීම සඳහා අධිකරණය විසින් කාරණය දින තිහකට නොවැඩි කාලයකට අඩාලව කල් තබනු ලැබිය හැකි ය.

(7) මේ පනතේ කුමක් සඳහන් ව ඇත ද (6) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද යම් විරෝධයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් සලකා බලා ඒ ගැන අවසානාත්මක විය යුතු තමාගේ තීරණය දිය යුතු අතර ඔහු විසින් එම තීරණය මහේස්ත්‍රාත්වරයාට සහතික කරනු ලැබිය යුතු ය. ඊට පසු එම තීරණය යටතේ අඩු කරන ලද හෝ ස්ථිර කරන ලද නිෂ්පාදන බද්ද ගෙවීම බලාත්මක කිරීම සඳහා මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු නැවත කරගෙන යා යුතුය. එම උපවගන්තිය යටතේ කාරණය අඩාලව කල් තැබූ කාල පරිච්ඡේදය ඇතුළත අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත විරෝධයක් ඉදිරිපත් කර නැති අවස්ථාවක ඒ බවට වූ සහතිකයක් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නිකුත් කළ යුතු අතර නිෂ්පාදන බද්ද ගෙවීම බලාත්මක කිරීම සඳහා මේ වගන්තිය යටතේ වූ නඩු කටයුතු නැවත කරගෙන යා යුතු ය.

නිෂ්පාදන බද්ද ආපසු ගෙවීම.

13. (1) යම් නිෂ්පාදන බදු මුදලක් ආපසු ගෙවන ලෙස හිමිකම් පාන යම් තැනැත්තකු විසින්—

(අ) ගෙවන ලද නිෂ්පාදන බද්ද මේ පනත යටතේ ගෙවිය යුතු මුදලට වැඩි වීමේ හේතුව ; හෝ

(ආ) නිෂ්පාදන බද්ද ගෙවන ලද්දේ යම් භාණ්ඩ වෙනුවෙන් ද ඒ භාණ්ඩ බද්දට යටත් නොවීමේ හේතුව

මත, අදාළ දිනයේ සිට මාස දොළහක් ඉකුත් වීමට පෙර, ඒ බද්ද ආපසු ගෙවීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉල්ලීමක් කළ යුතු ය :

එසේ වුවද, මේ උපවගන්තියෙහි සඳහන් මාස දොළහේ සීමාව, යම් තැනැත්තකු විසින් නිෂ්පාදන බද්ද විරුද්ධත්වයට යටත්ව ගෙවනු ලැබ ඇති අවස්ථාවක අදාළ නොවිය යුතු ය.

(2) එවැනි යම් ඉල්ලීමක් ලැබුණු පසු, ඉල්ලුම්කරු විසින් ගෙවන ලද නිෂ්පාදන බද්දේ මුළු ප්‍රමාණය හෝ එහි යම් කොටසක් ඔහුට ආපසු ගෙවිය යුතු බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් වන්නේ නම්, ඔහු විසින් ඒ අනුව නියමයක් කරනු ලැබිය හැකි ය.

(3) ආපසු ගෙවීමක් කිරීම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, ස්වකීය තීරණය ඒ සඳහා වූ හේතු සමග ඔහු විසින් ඉල්ලුම්කරුට දැන්විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ නිෂ්පාදන බද්දේ ආපසු ගෙවීමක් කිරීම ප්‍රතික්ෂේප කරමින් අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් කරන ලද තීරණයෙන් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්

ඒ තීරණය තමා වෙත දන්වන ලද දිනයේ සිට එක් මාසයක් ඇතුළත දී ඊට විරුද්ධව භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත අභියාචනය කළ හැකි ය.

(5) (4) වන උපවගන්තිය යටතේ වූ අභියාචනයක් කරනු ලැබූ විට, භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා විසින්—

(අ) අභියාචනයට ඉඩ දී, ඉල්ලුම්කරු විසින් අධ්‍යක්ෂ ජනරාල් වරයාට ගෙවන ලද නිෂ්පාදන බද්ද ආපසු ගෙවන ලෙස අධ්‍යක්ෂ ජනරාල්වරයාට විධාන කරනු ලැබිය හැකි ය ; නැතහොත්

(ආ) අභියාචනය ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(6) (5) වන උපවගන්තිය යටතේ තමාට දෙන ලද යම් විධානය කට අනුකූලව අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ක්‍රියා කළ යුතු ය.

## IV වන කොටස

### ලියාපදිංචි කිරීම

ලියාපදිංචි කිරීම.

14. (1) 3 වන වගන්තිය යටතේ කරන ලද නියමයක් ප්‍රකාර යම් භාණ්ඩයක් නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් වූ දිනයේ සිට මාස දෙකක කාල පරිච්ඡේදයක් ඉකුත් වන දිනයේ දී සහ ඉන් පසුව කිසිම තැනැත්තකු විසින් තමා මේ පනතේ කාර්ය සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලියාපදිංචි වී ඇත්තේ නම් මිස—

(අ) ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩය නිපදවීම හෝ සෑදීම ;

(ආ) තමා වෙනුවෙන් ම හෝ තැරැව්කරුවකු හෝ කොමිස් නියෝජිතයකු වශයෙන් හෝ තොග වෙළෙඳාමේ කාර්ය සඳහා නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ තොග මිලට ගැනීම හෝ විකිණීම නැතහොත් එවැනි යම් භාණ්ඩ ගබඩා කිරීම ; හෝ

(ඇ) නිෂ්පාදන බද්දට යටත් එවැනි යම් භාණ්ඩ ආනයනය කිරීම

නොකළ යුතු ය.

(2) (අ) ලියාපදිංචි කිරීම සඳහා වූ ඉල්ලීමක්, නියමිත ආකෘති යෙහි නියමිත ආකාරයෙන් නියමිත ගාස්තුව සමඟ අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(ආ) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලබන සෑම තැනැත්ත කුටම අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් නියමිත ආකෘතියෙහි වූ ලියාපදිංචි කිරීමේ සහතිකයක් නිකුත් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද සෑම තැනැත්තකු විසින් ම, නියමිත ආකෘතියෙහි සහ නියමිත අතරවාරවලදී—

(අ) ඒ තැනැත්තා නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක නිෂ්පාදකයා හෝ සාදන්නා වන අවස්ථාවක නම්—

(i) නියමිත කාල පරිච්ඡේදයක් තුළ දී කර්මාන්තශාලාවේ දී හෝ ඔහු විසින් ඒ නිෂ්පාදන බද්දට යටත්

භාණ්ඩ නිපදවන්නා වූ හෝ සාදන්නා වූ වෙනත් ස්ථානයේ දී ඔහු විසින් නිපදවන ලද හෝ සාදන ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩවල සංඛ්‍යාව ද ;

(ii) ඒ කාල පරිච්ඡේදය තුළ දී ඒ කර්මාන්තශාලාවෙන් හෝ වෙනත් ස්ථානයෙන් ඉවත් කර ගෙන යන ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩවල සංඛ්‍යාව ද ;

(iii) ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ මත ගෙවන ලද නිෂ්පාදන බද්ද ද,

දැක්වෙන වාර්තා ද ;

(ආ) ඒ තැනැත්තා නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක ආනයනකරු වන අවස්ථාවක නම්—

(i) නියමිත කාලපරිච්ඡේදයක් තුළ දී ඔහු විසින් ආනයනය කරන ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩවල සංඛ්‍යාව ද ;

(ii) ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ ගබඩා කර ඇති හෝ තබා ඇති රේගු ගුදම හෝ ස්ථානය සහ ඒ කාලපරිච්ඡේදය තුළ දී ඒ ගුදමෙන් හෝ ස්ථානයෙන් ඉවත්කර ගෙන යන ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සංඛ්‍යාව ද ;

(iii) ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ මත ගෙවන ලද නිෂ්පාදන බද්ද ද,

දැක්වෙන වාර්තා ද ;

(ඇ) නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩවල තොග වෙළෙන්දකු සම්බන්ධයෙන් වන විට—

(i) නියමිත කාලපරිච්ඡේදයක් තුළ දී ඔහු විසින් මිලට ගන්නා ලද හෝ ගබඩා කර තබන ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩවල සංඛ්‍යාව සහ එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ ඔහු විසින් මිලට ගන්නා ලද්දේ යම් තැනැත්තන්ගෙන් ද ඒ තැනැත්තන්ගේ නම් ද ;

(ii) ඒ කාලපරිච්ඡේදය තුළ දී ඔහු විසින් සිල්ලරට විකුණන ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සංඛ්‍යාව සහ එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ ඔහුගෙන් මිලට ගත් තැනැත්තන්ගේ නම් ද ;

(iii) ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ ගබඩාකර හෝ තබා තිබුණු ස්ථානයෙන් ඉවත්කරගෙන යන ලද

නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සංඛ්‍යාව සහ එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ ඉවත්කරගෙන ගිය තැනැත්තන්ගේ නම් ද

දැක්වෙන වාර්තා ද ;

(ආ) ලියාපදිංචි කළ ගුදමක අයිතිකරු සම්බන්ධයෙන් වන විට නියමිත කාලපරිච්ඡේදය තුළ දී—

(i) ඒ ගුදමෙහි ගබඩාකර තිබුණු නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සංඛ්‍යාව ද ;

(ii) ඒ ගුදමෙන් ඉවත්කර ගෙන යනු ලැබූ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සංඛ්‍යාව ද එම නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ ඉවත්කර ගෙන ගිය තැනැත්තන්ගේ නම් ද

දැක්වෙන වාර්තා ද

අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත සපයනු ලැබිය යුතු ය.

ඇතැම් තැනැත්තන් විසින් ප්‍රතිපාර්ශ්වීය ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු බව.

15. මේ පනත යටතේ ලියාපදිංචි කිරීම සඳහා ඉල්ලුම්කරන සෑම තැනැත්තකුම නියමිත ආකෘතියෙහි වූ ප්‍රතිපාර්ශ්වීය ගිවිසුමක් ලියා අත්සන් කළ යුතු බව ද, අධ්‍යක්ෂජනරාල්වරයා විසින් නියම කරනු ලබන පරිදි සිය ගිවිසුම ඉටු කිරීම සම්බන්ධයෙන් ඇප තැබිය යුතු බව ද නියම කරනු ලැබිය යුතු ය.

ලියාපදිංචි කිරීම අත්හිටුවීම.

16. (1) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ යම් තැනැත්තකු

(අ) මේ පනත යටතේ ඔහු විසින් ගෙවිය යුතු යම් නිෂ්පාදන බද්දක් ගෙවීම පැහැර හැර ඇති බවට ;

(ආ) මේ පනත යටතේ වූ යම් වරදකට වරදකරු කරනු ලැබ ඇති බවට ;

(ඇ) අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ යම් නිෂ්පාදන බදු නිලධරයකුට සපයන ලද යම් වාර්තාවක අසත්‍ය ප්‍රකාශයක් කර ඇති බවට ; හෝ

(ඈ) මේ පනතින් හෝ ඒ යටතේ හෝ ඔහුට පනවන ලද යම් නියමයකට පටහැණි ව අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ යම් නිෂ්පාදන බදු නිලධරයකුට යම් වාර්තාවක් සපයා නැති බවට

අධ්‍යක්ෂ ජනරාල්වරයා සෑහීමට පත් වන අවස්ථාවක, ඔහු විසින් කරනු ලබන නියමයක් මගින්, ඒ නියමයෙහි නිශ්චිතව සඳහන් කරනු ලබන එක් අවුරුද්දක් නොඉක්මවන කාල පරිච්ඡේදයක් තුළ එම ලියාපදිංචි කිරීම අත්හිටවනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් තැනැත්තකුට විරුද්ධ කිසිම නියමයක් ඒ නියමය නොකළ යුත්තේ මන්දැයි නිශ්චිතව සඳහන් කාලපරිච්ඡේදය තුළ දී කරුණු දැක්වීම පිණිස වූ දැන්වීමක් ඔහුට කිරීමෙන් පසුව ද, ඒ කාලපරිච්ඡේදය තුළ ඔහු විසින් කරුණු දැක්වීමට අපොහොසත් වුවහොත් හෝ ඔහු විසින් සෑහෙන හේතු නොපෙන්වුවහොත් ද හැර නොකළ යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නියමයක් තමාට විරුද්ධව කරනු ලැබූ යම් තැනැත්තකු විසින් ඒ නියමය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුට දන්වන ලද දිනයෙන් පසු දින දහයක් ඉකුත් වීමට පෙර භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත ලියවිල්ලකින් වූ අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය. භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයා වෙත එවැනි අභියාචනයක් කරනු ලැබූ විට ඒ අභියාචනය ඉදිරිපත් කර ඇත්තේ යම් නියමයකට විරුද්ධව ද ඒ නියමය ඔහු විසින් ස්ථිර කිරීම, වෙනස් කිරීම හෝ නිෂ්ප්‍රභ කිරීම කරනු ලැබිය හැකි ය.

(4) (1) වන උපවගන්තිය යටතේ කරන ලද නියමයක් ඒ නියමය අදාළ තැනැත්තාට අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් දැනුම් දුන් දිනයේ දී බලාත්මක විය යුතු අතර, ඒ නියමයට විරුද්ධව භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට අභියාචනයක් ඉදිරිපත් කර තිබුන ද දිගට ම බලාත්මක ව තිබිය යුතු ය.

(5) (4) වන උපවගන්තියේ සඳහන් කරන ලද යම් නියමයක්, අදාළ තැනැත්තාගේ සාමාන්‍ය ව්‍යාපාරික ස්ථානයට ලියාපදිංචි කළ තැපැලෙන් යවන ලිපියකින් ඒ දැන්වීම ඔහු වෙත තැපැල් කළ දිනයේ සිට දින තුනක් ඉකුත් වීමෙන් පසු ඔහුට දැනුම් දෙනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

උපරිම ප්‍රමාණය.

17. (1) නිෂ්පාදන බද්ද ගෙවීම මගහැරීම වැළැක්වීමේ කාර්යය සඳහා සහ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් සාමාන්‍යයෙන් භාවිත කරනු ලබන කාර්යය ගැන සැලකිල්ල ඇති ව, 14 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරන ලද තැනැත්තකු නොවන තැනැත්තකු විසින් සිය සන්තකයේ හෝ පාලනය යටතේ තබා ගත හැකි ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයේ උපරිම ප්‍රමාණය අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.

(2) නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් සම්බන්ධයෙන් (1) වන උපවගන්තිය යටතේ නියම කරනු ලබන ප්‍රමාණය, නියත ගණනක් හෝ නියමිත ආගණන ක්‍රමයකට අනුව නිර්ණය කරනු ලබන ගණනක් විය හැකි ය.

(3) 14 වන වගන්තිය යටතේ ලියාපදිංචි නොකළ කිසිදු තැනැත්තකු විසින්, නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් සම්බන්ධයෙන් නියම කරනු ලැබ ඇති උපරිම ප්‍රමාණයට වැඩි, ඒ නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩවල යම් ප්‍රමාණයක් තමාගේ සන්තකයේ හෝ තමාගේ පාලනය යටතේ හෝ තබා නොගත යුතු ය.

සහතිකය ආපසු භාර දීම.

18. 14 වන වගන්තිය යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති යම් තැනැත්තකු විසින්, සිය ලියාපදිංචි කිරීමේ සහතිකය ආපසු භාර දීමට අදහස් කරන බවට අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ලියවිල්ලකින් දෙනු ලබන එක් මාසයක දැනුම්දීමක් ඉකුත් වීමෙන් පසුව සහ ඒ තැනැත්තා විසින් සාදන ලද හෝ ශ්‍රී ලංකාවට ආනයනය කරන ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ මත අය විය යුතු නිෂ්පාදන බද්ද ගෙවීමෙන් පසුව ඔහුගේ ලියාපදිංචි කිරීමේ සහතිකය ආපසු භාර දෙනු ලැබිය හැකි ය.

## V වන කොටස

### නිෂ්පාදන බදු නිලධරයන්ගේ බලතල හා කාර්ය

පරීක්ෂා කිරීමේ බලතල.

19. (1) අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලියවිල්ලකින් බලය දෙනු ලැබූ නිෂ්පාදන බදු නිලධරයකු විසින්, සාම නිලධරයකු ද කැටුව, නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් නිපදවන, සාදන හෝ ගබඩා කර ඇති හෝ තබා ඇති කර්මාන්ත ශාලාවකට, ගුදමකට හෝ වෙනත් යම් ස්ථානයකට ඇතුල් වී එය පරීක්ෂා කරනු ලැබිය හැකි අතර, එහි පහත සඳහන් සියලු ක්‍රියා හෝ ඉන් යම් ක්‍රියාවක් හෝ කරනු ලැබිය හැකි ය :—

(අ) එහි තිබෙන යම් නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩවල ලේඛනයක් සෑදීම ;

(ආ) යම් ගිණුම් පොතක් ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් යම් ලියවිල්ලක් තබා ඇති යම් ග්‍රාහකයක් විවෘත කොට පරීක්ෂා කිරීම ;

(ඇ) එවැනි යම් ගිණුම් පොතක්, ලේඛනයක්, වාර්තාවක් හෝ වෙනත් ලියවිල්ලක් පරීක්ෂා කර එහි පිටපත් සෑදීම හෝ එහි උධෘතයක් ගැනීම ;

(ඈ) ඒ කර්මාන්තශාලාවෙහි, ගුදමෙහි හෝ වෙනත් ස්ථානයෙහි සිටින යම් තැනැත්තකුගෙන්, මේ පනතේ විධිවිධානවලට අනුකූලතාව දැක්වෙන්නේ ද යන බව දැන ගැනීම සඳහා හෝ මේ පනත යටතේ ඉදිරිපත් කර ඇති යම් වාර්තාවක නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය විමසීම් කිරීම ; හෝ

(ඉ) ඒ කර්මාන්තශාලාවෙහි, ගුදමෙහි හෝ වෙනත් ස්ථානයෙහි ඒ කාර්ය සඳහා හෝ මේ පනත යටතේ ඉදිරිපත් කර ඇති යම් වාර්තාවක නිරවද්‍යතාව පරීක්ෂා කිරීම සඳහා අවශ්‍ය වෙනත් විමර්ශන කිරීම.

(2) යම් නිෂ්පාදන බදු නිලධරයකුට (1) වන උපවගන්තිය යටතේ වූ බලතල ක්‍රියාවේ යෙදීම පිණිස බලය දීමට පෙර, ඒ නිලධරයා විසින් එම බලතල ක්‍රියාවේ යෙදීම අවශ්‍ය කෙරෙන අවස්ථාගත කරුණු අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් වාර්තාගත කළ යුතුය.

සිරභාරයට ගැනීමේ හා සෝදිසි කිරීමේ බලතල.

20. (1) යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ වූ වරදක් කර ඇති බව විශ්වාස කිරීමට සාම නිලධරයකුට සාධාරණ හේතු ඇති අවස්ථාවක, ඔහු විසින්—

(අ) තමා විසින් පරීක්ෂා කර බැලීම සඳහා ඒ තැනැත්තාගේ සන්තකයේ ඇති යම් නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් හෝ ලියාපදිංචි කිරීමේ සහතිකය හෝ මේ පනතේ විධිවිධාන යටතේ ඔහුට නිකුත් කරන ලද හෝ ඔහු විසින් තබා ගත යුතු බවට නියම කරන ලද වෙනත් ලියවිල්ලක් ඉදිරිපත් කරන ලෙස ඒ තැනැත්තාට නියම කරනු ලැබිය හැකි ය ;

(ආ) යම් තැනැත්තකු හෝ යම් බෝට්ටුවක් හෝ යාත්‍රාවක් හෝ වාහනයක් නවතා සෝදිසි කිරීමට සහ ඒ තැනැත්තා වෙත තිබෙන හෝ ඒ බෝට්ටුවේ, යාත්‍රාවේ හෝ වාහනයේ ගෙන යනු ලබන යම් ඇසුරුමක් හෝ භාජනයක් විවෘත කොට සෝදිසි කළ හැකි ය;

(ඇ) එවැනි යම් තැනැත්තකුගේ සන්තකයේ ඇත්තා වූ සහ වරදක් කිරීමට අදාළ වන බවට ඒ නිලධරයාට පෙනී යන්නා වූ යම් නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් තහනමට ගනු ලැබිය හැකි ය;

(ඈ) එවැනි යම් තැනැත්තකුගේ සන්තකයේ ඇති වරදට සාක්ෂි වශයෙන් ඉදිරිපත් කරනු ලැබිය හැකි යම් ලේඛන යක් තහනමට ගනු ලැබිය හැකි ය;

(ඉ) ඒ තැනැත්තාට විරුද්ධව ඉදිරිපත් කෙරෙන යම් චෝදනාව කට ඒ තැනැත්තා පෙනී සිට උත්තර දෙන බවට ඒ නිලධරයා සෑහීමට පත්වන්නේ නම් මිස, වරෙන්තුවක් රහිතව ඒ තැනැත්තා සිරභාරයට ගෙන රඳවා ගැනීම සහ ඔහුගේ වරදට සාක්ෂි වශයෙන් ඉදිරිපත් කළ හැකි ඔහු සන්තකයේ ඇති ඕනෑම දෙයක් තහනමට ගැනීම කළ හැකි ය; නැතහොත්

(ඊ) වරද කිරීමේ දී පාවිච්චි කරන ලද්දේ යයි ඒ නිලධරයාට පෙනී යන්නා වූ හෝ ඒ වරදට සාක්ෂි ලෙස ඉදිරිපත් කළ හැකි යම් බෝට්ටුවක්, යාත්‍රාවක්, වාහනයක් හෝ වෙනත් යම් භාණ්ඩයක් හෝ උපකරණයක් තහනමට ගත හැකි ය.

(2) මේ වගන්තියෙහි—

(i) "වාහනය" යන්නට යම් රියක්, රථයක්, කරත්තයක්, මෝටර් කාර් රථයක්, මෝටර් බයිසිකලයක්, බස් රථයක්, ට්‍රැක්ටරයක්, ලොරියක්, බයිසිකල යක්, හෝ යන්ත්‍රානුසාරයෙන් ධාවනය කෙරෙන වෙනත් වාහනයක් ඇතුළත් වේ; තවද

(ii) "යාත්‍රාව" යන්නට ගුවන් යානයක් ඇතුළත් වේ.

21. සිරභාරයට ගැනීම, සෝදිසි කිරීම, සෝදිසි වරෙන්තු, සිර භාරයට ගනු ලැබූ තැනැත්තන් ඇප පිට හෝ බැඳුම්කර ලියා අත්සන් කිරීම පිට මුදා හැරීම, සිරභාරයට ගනු ලැබූ තැනැත්තන් ඉදිරිපත් කිරීම සහ වරදවල් පිළිබඳ විමර්ශනය කිරීම සම්බන්ධ යෙන් 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ වූ විධිවිධාන, මේ පනත යටතේ ඒ කරුණු සම්බන්ධයෙන් කරනු ලබන සියලු ක්‍රියාවලට අදාළ විය යුතු ය.

සිරභාරයට ගැනීම සෝදිසි කිරීම ආදිය කළ යුත්තේ කෙසේ ද යන වග.

ඇතැම් දෙපාර්තමේන්තුවල නිලධරයන් වරදවල් වාර්තා කිරීමට බැඳී සිටින බව හා සහාය විය යුතු බව.

22. පොලීසියේ, රේගු දෙපාර්තමේන්තුවේ සහ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ සෑම නිලධරයෙක් සහ සෑම ග්‍රාම සේවා නිලධාරියෙක් තමාට දැනගැනීමට ලැබෙන මේ පනතේ විධිවිධාන පිළිබඳ සියලු කඩකිරීම් සම්බන්ධයෙන් මේ පනත යටතේ පත් කරන ලද නිෂ්පාදන බදු නිලධරයකුට වහාම තොරතුරු සැපයීමට ද, ඒ නිෂ්පාදන බදු නිලධරයා විසින් ඉල්ලා සිටි විට, මේ පනතේ විධිවිධාන ක්‍රියාවේ යෙදවීමෙහිලා ඒ නිෂ්පාදන බදු නිලධරයාට සහාය වීමට ද බැඳී සිටින්නා හ:

එසේ වුව ද, ඒ නිලධරයා හෝ ග්‍රාම සේවා නිලධාරියා විසින් යම් තොරතුරක් දෙනු ලැබීම වෙනත් යම් නීතියකින් තහනම් කරනු ලැබ ඇති අවස්ථාවක එවැනි තොරතුරක් නිෂ්පාදන බදු නිලධරයකුට දීමට ඒ නිලධරයාට හෝ ග්‍රාම සේවා නිලධාරියාට හෝ මේ වගන්තියේ කිසිවක් නියම කරතැයි අර්ථ දැක්විම නොකළ යුතු ය.

වරදවල් සංඥෙය හා ඇපදිය හැකි වරදවල් බව.

23. 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ පළමුවන උපලේඛනයෙහි පටහැනිව කුමක් සඳහන් වී ඇත ද, මේ පනත යටතේ වූ සෑම වරදක් ම එම පනතේ අර්ථානුකූලව සංඥෙය වරදක් හා ඇප දිය හැකි වරදක් විය යුතු ය.

## VI වන කොටස

## වරදවල්

වරදවල්.

24. (1) 4 වන වගන්තියේ හෝ 6 වන වගන්තියේ හෝ 14 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයකට දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුතුය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද නිෂ්පාදන බදු නිලධරයකු වෙත 19 වන වගන්තියෙන් පැවරී ඇති බලතල ක්‍රියාත්මක කිරීමේ දී අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ එවැනි නිෂ්පාදන බදු නිලධරයකුට විරෝධය පාන හෝ බාධා කරන නැතහොත් ඒ වගන්තිය යටතේ තමාගෙන් කරන ලද යම් විමසීමකට, හේතු නොමැතිව, උත්තර දීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමකට හෝ ඒ දඩය හෝ බන්ධනාගාරගත කිරීම යන දෙකටම හෝ යටත් විය යුතු ය.

(3) (අ) 20 වන වගන්තියේ විධිවිධාන යටතේ ක්‍රියා කරන නිෂ්පාදන බදු නිලධරයකු විසින් ඉල්ලා සිටි විට

යම් බෝට්ටුවක්, යාත්‍රාවක් හෝ වාහනයක් නතර නොකරන හෝ නතර කිරීම ප්‍රතික්ෂේප කරන යම් තැනැත්තකු ;

(ආ) 20 වන වගන්තියේ විධිවිධාන යටතේ ක්‍රියා කරන නිෂ්පාදන බදු නිලධරයකුට යම් බෝට්ටුවක්, යාත්‍රාවක් හෝ වාහනයක් සෝදිසි කිරීමට ඉඩ නොදෙන යම් තැනැත්තකු ; හෝ

(ඇ) 20 වන වගන්තියේ විධිවිධාන යටතේ ක්‍රියා කරන නිෂ්පාදන බදු නිලධරයකු විසින් සෝදිසි කරනු ලැබීම ප්‍රතික්ෂේප කරන හෝ එවැනි නිලධරයකුට බාධා කරන හෝ විරෝධය පාන නැත හොත් එවැනි නිලධරයකුගේ අත්අඩංගුවෙන් බේරී යන හෝ බේරී යාමට තැත් කරන යම් තැනැත්තකු

මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් පණස් දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාර ගත කිරීමකට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

(4) 22 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලතාව නොදක්වන පොලිසියේ, රේගු දෙපාර්තමේන්තුවේ හෝ දේශීය ආදායම් දෙපාර්තමේන්තුවේ යම් නිලධරයකු හෝ යම් ග්‍රාම සේවා නිලධාරියකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දෙදහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(5)මේ පනත යටතේ සාදන ලද යම් නියෝගයක් කඩ කරන යම් තැනැත්තකු මේ පනත යටතේ වූ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් දස දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(6) නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් සම්බන්ධයෙන් නියෝග මගින් නියම කරනු ලැබ ඇති උපරිම ප්‍රමාණයකට අධික ඒ භාණ්ඩ ප්‍රමාණයක් සන්තකයේ ඇතිව සිටින මේ පනත යටතේ ලියාපදිංචි කරන ලද තැනැත්තකු නොවන යම් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී රුපියල් විසිපන් දහසක් නොඉක්මවන දඩයකට හෝ එක් අවුරුද්දකට වැඩි නොවන කාලයක් දෙයාකාරයෙන් එක් ආකාරයක බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාර ගත කිරීම යන දෙකට ම හෝ යටත් විය යුතු ය.

පුද්ගල මණ්ඩල විසින් කෙරෙන වරදවල්.

25. පුද්ගල මණ්ඩලයක් විසින් මේ පනත යටතේ වූ වරදක් කරන ලද අවස්ථාවක—

(අ) ඒ පුද්ගල මණ්ඩලය, සංස්ථාවක් වේ නම්, වරද කරන ලද අවස්ථාවේ ඒ මණ්ඩලයේ අධ්‍යක්ෂවරයා, ලේකම්වරයා හෝ වෙනත් සමාන නිලධරයකු වී සිටි සෑම තැනැත්තකු ම හෝ ;

(ආ) ඒ මණ්ඩලය සංස්ථාවක් නොවේ නම්, වරද කරන ලද අවස්ථාවේ ඒ මණ්ඩලයේ සාමාජිකයකු හෝ හවුල්කරුවකු වී සිටි සෑම තැනැත්තකු ම

ඒ වරද කරන ලද්දේ ඔහුගේ දැනුමක් නොමැතිව බව හෝ ඒ වරද කිරීම වැළැක්වීමට ඔහු සියලු නිසි උද්‍යෝගයෙන් ක්‍රියා කළ බව හෝ ඔප්පු කළ හොත් මිස ඒ වරදට වරදකරුවකු විය යුතු ය.

රාජ්‍ය සන්තක කිරීමට අධිකරණයට ඇති බලය.

26. (1) මේ පනත යටතේ වූ වරදක් සම්බන්ධයෙන් යම් තැනැත්තකු වරදකරු කරනු ලැබූ අවස්ථාවක, වරද කිරීමෙහි ලා හෝ ඒ සම්බන්ධයෙන් භාවිත කරනු ලැබූ යම් බෝට්ටුවක්, යාත්‍රාවක්, වාහනයක් හෝ (නිෂ්පාදන බද්දට යටත් හෝ යටත් නොවන) භාණ්ඩයක්, එසේ වරදකරු කරනු ලැබීම ප්‍රකාර, රාජ්‍ය සන්තක විය යුතු ය.

(2) (1) වන උපවගන්තිය ක්‍රියාත්මක වීමෙන් රාජ්‍යසන්තක වන්නා වූ යම් බෝට්ටුවක්, යාත්‍රාවක්, වාහනයක් හෝ භාණ්ඩයක් රාජ්‍ය වෙත පරම වශයෙන් ම සතු විය යුතු ය. ඒ සතු වීම—

(අ) අභියාචනාධිකරණයට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද මහාධිකරණයට හෝ ඒ වරදකරු කිරීමට විරුද්ධව අභියාචනයක් ඉදිරිපත් කිරීමට හැකි කාල පරිච්ඡේදය ඉකුත් වීමෙන් පසු ; හෝ

(ආ) වරදකරු කිරීමට විරුද්ධව අභියාචනාධිකරණයට හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාවෙන් පිහිටුවන ලද මහාධිකරණයකට හෝ අභියාචනයක් ඉදිරිපත් කර ඇති අවස්ථාවක ඒ වරදකරු කිරීම ස්ථිර කරමින් හෝ අනුමත කරමින් ඒ අභියාචනය තීරණය කිරීමෙන් පසු

ක්‍රියාත්මක විය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ රාජ්‍යය වෙත සතුවුණු යම් බෝට්ටුවක, යාත්‍රාවක, වාහනයක හෝ භාණ්ඩයක සන්තකය අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බලය දෙන ලද තැනැත්තකු විසින් ගත යුතු අතර, ඔහු විසින් සුදුසු යයි කල්පනා කරන අන්දමට ඒවා විකිණීමෙන් හෝ අන්‍යාකාරයෙන් බැහැර කරනු ලැබිය හැකි ය.

වරදවල් සමථයකට පත් කිරීම.

27. වරද කරනු ලැබූ අවස්ථාගත කරුණු සැලකිල්ලට ගනිමින් සහ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමතය ඇතිව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, ඒ වරද සඳහා නියම කළ හැකි උපරිම දඩයෙන් පහෙන් එකකට අඩු නොවන ප්‍රමාණයකට සමාන

මුදල් ප්‍රමාණයක් සඳහා මේ පනත යටතේ වූ යම් වරදක් සමථය කට පත් කරනු ලැබිය හැකිය ; තවද සමථයකට පත් කිරීමේ කොටසක් වශයෙන්, ඒ ලේකම්වරයාගේ අනුමතය, ඇතිව 20 වන වගන්තිය යටතේ තහනමට ගන්නා ලද යම් බෝට්ටුවක්, යාත්‍රාවක්, වාහනයක් හෝ භාණ්ඩයක්, බෝට්ටුවේ, යාත්‍රාවේ, වාහනයේ හෝ භාණ්ඩයේ ඇස්තමේන්තු කරන ලද මුළු වටිනාකමට වැඩි නොවන මුදල් ප්‍රමාණයක් ගෙවීමෙන් පසු, මුදා හරිනු ලැබිය හැකි ය. වරදක් සමථයකට පත් කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ලබාගන්නා සියලු මුදල් 28 වන වගන්තියෙහි දක්වා ඇති ආකාරයට යොදාගත යුතු ය.

## VII වන කොටස

## පොදු විධිවිධාන

මේ පනත යටතේ අයකර ගන්නා ලද රාජසන්තක කිරීම් හා දණ්ඩන මුදල් වැය කිරීම.

28. (අ) 27 වන වගන්තියෙහි සඳහන් කරන ලද සියලු මුදල් ප්‍රමාණයන්, සහ

(ආ) 26 වන වගන්තිය යටතේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් බැහැර කරනු ලැබිය හැකි සියලු භාණ්ඩ විකිණීමෙන් ලත් මුදල්

අධ්‍යක්ෂ ජනරාල්වරයාට ගෙවනු ලැබිය යුතු අතර, ඒවා (දරන ලද යම් වියදමක් අඩුකර ගැනීමෙන් පසුව) පහත දැක්වෙන ආකාරයට යෙදවිය යුතුය :—

(i) ඉන් එක් අර්ධයක්, ඒකාබද්ධ අරමුදලට බැර කිරීම පිණිස භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට ;

(ii) ඉතිරි අර්ධයෙන් සියයට පණහක්, නිෂ්පාදන බදු නිලධාරීන් සහ තොරතුරු සපයන්නන් අතර අමාත්‍යවරයා විසින් අනුමත කරනු ලබන යෝජනා ක්‍රමයකට අනුව බෙදා හැරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ පාලනය යටතේ වන තෑගි අරමුදලකට ; සහ

(iii) ඉතිරි අර්ධයේ අනිත් සියයට පණහ, මේ පනත යටතේ සිය කර්තව්‍ය ඉටු කිරීම සඳහා අධ්‍යක්ෂ ජනරාල්වරයාට සහ නිෂ්පාදන බදු නිලධරයන්ට අවශ්‍ය වන වාහන අත්කර ගැනීමට සහ නඩත්තු කිරීමට.

නියෝග.

29. (1) පහත දැක්වෙන සියලුම කරුණු හෝ ඉන් යම් කරුණක් සඳහා හා සම්බන්ධයෙන් අමාත්‍යවරයා විසින් නියෝග සාදනු ලැබිය හැකිය :—

(අ) අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නියමයන්ට එරෙහිව භාණ්ඩාගාරයේ නියෝජ්‍ය ලේකම්වරයාට කෙරෙන අභියාචන විෂයෙහි වූ කාර්ය පරිපාටිය නියම කිරීම ;

(ආ) මේ පනත යටතේ අයකර ගනු ලබන නිෂ්පාදන බද්ද ආදායමට බැර කළ යුතු ආකාරය සහ බද්ද ගෙවීම සම්බන්ධයෙන් තැබිය යුතු ගිණුම් නියම කිරීම ;

(ඇ) මේ පනත යටතේ ලියාපදිංචි කිරීම වෙනුවෙන් ගෙවිය යුතු ගාස්තු නියම කිරීම ;

(ඈ) නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සාදන්නන්, නිපදවන්නන් සහ ආනයනකරුවන් විසින් නිෂ්පාදන බද්ද ගෙවිය යුතු ආකාරය නියම කිරීම ;

(ඉ) මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබූ තැනැත්තකු විසින් නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ ආනයනය කිරීම, අපනයනය කිරීම, සෑදීම, ගබඩා කිරීම හෝ විකිණීම සම්බන්ධයෙන් තබාගත යුතු ගිණුම් සහ ඒ ලියාපදිංචි කළ තැනැත්තන් විසින් අධ්‍යක්ෂ ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු වාර්තා නියම කිරීම ;

(ඊ) මේ පනත යටතේ වූ නිෂ්පාදන බදු නිලධරයන්ගේ කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා ඔවුනට කර්මාන්තශාලාවක් හෝ ගුදමක් ඇතුළත ඉඩපහසුකම් ලබා දෙන ලෙස මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති තැනැත්තකුට නියම කිරීම ;

(උ) බන්ධිත ගුදම් ලියාපදිංචි කිරීම, කළමනාකරණය සහ අධීක්ෂණය සඳහා සහ ඒ ගුදම්වලට භාණ්ඩ බාර ගැනීමේදී හෝ ඒවායින් භාණ්ඩ ඉවත්කරගෙන යාමේදී අනුගමනය කළ යුතු කාර්ය පරිපාටිය සඳහා විධිවිධාන යෙදීම ;

(ඌ) ශ්‍රී ලංකාවෙන් අපනයනය කරන ලද නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ මත ගෙවන ලද බද්ද පිළිබඳව ප්‍රතිදානයන් දීම සඳහා වූ කාර්ය පරිපාටිය සඳහා විධිවිධාන යෙදීම ; සහ

(එ) නියම කරනු ලැබිය යුතු යයි මේ පනත යටතේ නියමිත නැතහොත් නියෝග සෑදීමට බලය දෙනු ලැබූ යම් කාරණයක් සඳහා විධිවිධාන යෙදීම.

(2) (1) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කරනු ලැබූ දිනයේ දී හෝ නියෝගයේ නිශ්චිත ව සඳහන් කර ඇති පසු දිනකදී ක්‍රියාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදන ලද සෑම නියෝගයක්ම, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබීමෙන් පසු හැකි තාක් ඉක්මණින් අනුමතය සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරනු ලැබිය යුතුය ; එසේ අනුමත නොකරනු ලැබූ යම් නියෝගයක් අනනුමතයේ දිනයේ සිට පරිච්ඡින්න කරන ලද ලෙස සලකනු ලැබිය යුතුය. එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවක වලංගුභාවයට ඉන් හානියක් නොවිය යුතුය.

(4) යම් නියෝගයක් පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය පිළිබඳව නිවේදනය ගැසට් පත්‍රයෙහි පළ කරනු ලැබිය යුතුය.

නඩු වලින් ආරක්ෂාව.

**30.** (1) මේ පනතේ යම් විධිවිධානයක් ප්‍රකාර හෝ එසේ යයි අදහස් කර සද්භාවයෙන් කරන ලද ක්‍රියාවක් සම්බන්ධයෙන් අලාභ සඳහා යම් සිවිල් අධිකරණයක, අධ්‍යක්ෂ ජනරාල් වරයාට, නිෂ්පාදන බදු අධ්‍යක්ෂවරයාට හෝ යම් නිෂ්පාදන බදු නිලධරයකුට විරුද්ධව කිසිදු නඩුවක් පවරනු නොලැබිය යුතුය.

(2) මේ පනතේ යම් විධිවිධානයක් ප්‍රකාර හෝ එසේ යයි අදහස් කර අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ නිෂ්පාදන බදු අධ්‍යක්ෂවරයා හෝ යම් නිෂ්පාදන බදු නිලධරයකු හෝ විසින් කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධ කිසිදු නඩු පැවරීමක් පැමිණිලිකර සිටින ක්‍රියාවේ දිනයේ සිට එක් අවුරුද්දක් ඇතුළත පවරනු ලැබුවහොත් මිස, කිසිදු අධිකරණයක් විසින් පිළිගනු නොලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇතිවූ විට සිංහල පාඨය බල පැවැත්විය යුතු බව.

**31.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට සිංහල පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය.

**32.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මේ පනතෙහි—

"අපනයනය කිරීම" යන්නෙන් ශ්‍රී ලංකාවේ සීමාවෙන් පිට, මුහුදට හෝ විදේශීය භූමියකට ගෙන යාම අදහස් වේ;

"කර්මාන්තශාලාව" යන්නෙන්, නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ සාදන, යම් ස්ථානයක පරිශ්‍රයද ඇතුළත් යම් ස්ථානයක් හෝ එහි යම් කොටසක් නැතහොත්, එවැනි යම් භාණ්ඩයක් සෑදීමේ ක්‍රියාවලියට සම්බන්ධ යම් ක්‍රියාවක් කරගෙන යන හෝ එවැනි ක්‍රියාවක් සාමාන්‍යයෙන් කරගෙන යන යම් ස්ථානයක් හෝ එහි යම් කොටසක් අදහස් වන අතර, ඊට එවැනි යම් භාණ්ඩයක් සාදන හෝ ගබඩා කරන හෝ තබා තිබෙන ස්ථානයකට සම්බන්ධව පවත්වාගෙන යන ගුදමක් හෝ වෙනත් යම් ස්ථානයක් ද ඇතුළත් වේ;

"ආනයනය කිරීම" යන්නෙන් ශ්‍රී ලංකාවේ සීමාවෙන් පිට හෝ ඉන් ඔබ්බෙහි යම් ස්ථානයකින් මුහුදෙන් හෝ අහසින් ශ්‍රී ලංකාව තුළට ගෙන ඒම අදහස් වේ;

"සෑදීම" යන්නෙන්, යම් නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩයක් නිපදවීම, පිළියෙල කිරීම හෝ සකස් ගැනීම පිණිස යොදා ගන්නා ස්වභාවික හෝ කෘත්‍රිම හෝ සෑම ක්‍රියාවලියක්ම අදහස් වේ;

"නියමිත" යන්නෙන් මේ පනත යටතේ සාදන ලද නියෝග වලින් නියමිත බව අදහස් වේ;

"විකිණීම හෝ මිලට ගැනීම" යන්නෙන් එහි ව්‍යාකරණමය ප්‍රභේද සහ සම්බන්ධිත ප්‍රකාශ කිරීම් සමඟ යෙදෙන විට, ඉන් මුදල් සඳහා හෝ කල් දැමූ ගෙවීම් සඳහා හෝ වෙනත්

වටිනා ප්‍රතිඵලයක් සඳහා, වෙළඳාමක හෝ ව්‍යාපාරයක සාමාන්‍ය ක්‍රියාවලියේදී නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ වල සන්තකය එක් තැනැත්තකු විසින් තවත් තැනැත්තකුට පැවරීමක් අදහස් වේ;

"ප්‍රවාහනය" යන්නෙන් ශ්‍රී ලංකාව තුළ එක් ස්ථානයක සිට වෙනත් ස්ථානයකට චලනය කිරීම අදහස් වේ;

"තොග වෙළෙන්දා" යන්නෙන්, වෙළඳාමේ හෝ සැඳීමේ කාර්ය සඳහා නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ තොග ගණනේ මිළට ගන්නා හෝ විකුණන්නා වූ තැනැත්තකු අදහස් වන අතර, ඊට වෙනත් අය සඳහා නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ විකිණීම හෝ මිළට ගැනීම සඳහා ගිවිසුම් ඇති කර ගැනීමට අමතරව, විකිණීමේ කාර්ය සඳහා නියෝජිතයකු ලෙස වෙනත් තැනැත්තන්ට අයිති නිෂ්පාදන බද්දට යටත් භාණ්ඩ ගබඩා කරන තැරැව් කරුවකු හෝ වෙනත් කොටස් නියෝජිතයකු ද ඇතුළත් වේ.